# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 11,471—1958 අගෝස්තු 8 වැනි සිකුරාදා—8.8.1958**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)**


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

**(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොද ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)**



| | පිට |
|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ... | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ... | 2193 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් | 2193 |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් | 2194 |
| වෙනත් පත් කිරීම් ... ... ... | 2196 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 2196 |
| මිළ පාලන දන්වීම් .... .... .... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | 2201 |
| " සුරාබදු ආඥාපණත " පිළිබඳ දැන්වීම් ... | — |



## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම්

**1958 අංක 340**

අංකය: ඩී. /1/රෙක්ට/8.

**යුද්ධ හමුදව—නිත්‍ය භට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද කොමිෂන් බලපත්‍ර**

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් පහත සඳහන් කරන ලද මහත්වරුන් යුද්ධ හමුදවේ නිත්‍ය භට සේනාවේ කොමිෂන් බලපත්‍ර ලත් ලෙප්ටිනන්ට් වරුන් වශයෙන් පත් කිරීම සහ 1958 අගෝස්තු මස 1 වැනි දින සිට ඔවුන් පහත සඳහන් ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙලට ලංකා ඉංජිනේරු කණ්ඩායමට ඇතුළත් කිරීම අනුමත කොට තිබේ :—

කීර්තිසිරි විජය බටුවන්තුඩාව මහතා,

සෝමසිරි වික්‍රමසිංහ මහතා.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ජී. ද සොයිසා,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යංශයේ
ස්ථිර ලේකම්.

කොළඹ 1,
1958 ජූලි මස 28 දින.

---

**1958 අංක 341**

අංකය : ඩී. 31/රෙක්ට.

**යුද්ධ හමුදව—නිත්‍ය භට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම්**

1958 ජූනි මස 20 වැනි දින සිට ලෙප්ටිනන්ට් වරුන් වශයෙන්—

උප ලෙප්ටිනන්ට් තැන්පත් ආර්. යූ. ද ඇස්. සේනානායක, සී. ඒ. සී.
උප ලෙප්ටිනන්ට් තැන්පත් ඇල්. ඒ. බල්තසාර්, සී. ඇස්. ආර්.
උප ලෙප්ටිනන්ට් තැන්පත් ඇස්. ඇන්. දෙරනෑගම, සී. ඇස්. ආර්.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ජී. ද සොයිසා,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යංශයේ
ස්ථිර ලේකම්.

කොළඹ 1,
1958 අගෝස්තු මස 2 දින.

**1958 අංක 342**

අංකය : ඩී.32/රෙක්ට.

**රාජකීය ලංකා නාවුක හමුදව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්**

1958 ජූලි මස 12 වැනි දින සිට ලෙප්ටිනන්ට කොමාන්ඩර් (ඇල්) කෙනෙකු වශයෙන්—

ලෙප්ටිනන්ට (ඇල්) අයි. බී. ඊ. ප්‍රනාන්දු, රාජකීය ලංකා නාවුක හමුදව.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ජී. ද සොයිසා,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යංශයේ
ස්ථිර ලෙකම්.

කොළඹ 1,
1958 ජූලි මස 31 දින.

---

## රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම්

**1958 අංක 343**

රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම කරන ලෙස නියම කර ඇත්තේය :—

ඒ. 175/55.

ඩී. ආර්. ඇල්. බාලසූරිය මහතා (සී.සී.ඇස්.) 1958 ජූනි මස 4 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, පොළොන්නරුව පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත වශයෙන්.

ඒ. 198/58.

සී. විස්වාසම් මහතා (සී.සී.ඇස්.) 1958 ජූලි මස 1 වෙනි දින පටන්, නැවත නියමයක් කරන තුරු, කොළඹ රේගු දෙපාර්තමේන්තුවේ අතිරේක ගොඩබෑම් සමීක්ෂක හා සහකාර රේගු අයකැමි වශයෙන්.

ඒ. 209/58.

ඩී. අලුවිහාරේ මහතා (සී.සී.ඇස්.) 1858 ජූලි මස 7 වෙනි දින පටන්, නැවත නියමයක් කරන තුරු, ආණ්ඩුවේ දේශ සංචාරක කාර්‍යාංශයේ අධ්‍යක්ෂ වශයෙන්.

අංකය : ජේඑල්. 1/48.

ඩබ්ලිව්. ඊ. අබේකෝන් මහතා නැවත වැඩ බාරගන්නා තුරු, හෝ නැවත නියමයක් කරන තුරු, එස්. එම්. එම්. කසිම් මහතා 1958 අගෝස්තු 4 වැනි දින පටන්, හලාවත හා පුත්තලමේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හලාවත අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා පුත්තලමේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට, හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 68ඩී/53.

ඒ. වෛත්‍යලිංගම් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරනතුරු, පී. ජී. ද සිල්වා මහතා 1958 ජූලි 28 වැනි, 30 වැනි හා 31 වැනි දිනවල, අවිස්සාවේල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා අවිස්සාවේල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 63ඒ./58.

ජේ. ජී. එල්. සුවාරිස් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ඩබ්ලිව්. එම්. කුලතිලක මහතා 1958 ජූලි 26 වැනි දින පටන් 30 වැනි දින දක්වා, ගාල්ලේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, ගාල්ලේ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, හා ගාල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 67/48.

එස්. තම්බිදුරේ මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එම්. එසුරපාඩහම් මහතා 1958 අගෝස්තු 6 වැනි, 7 වැනි හා 8 වැනි දිනවල පේදුරු තුඩුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, පේදුරු තුඩුවේ අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා අතිරේක මහෙස් ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 7බී/56.

එල්. එච්. ද අල්විස් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ඇෆ්. ඊ. පොලියර් මහතා 1958 අගෝස්තු 1 වැනි දින පටන් 4 වැනි දින දක්වා, හම්බන්තොට අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, තංගල්ලේ අතිරේක මහෙස් ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා තංගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේජ්ජ්. 7/48.

ජේ. ඇෆ්. ඒ. සෝස මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ටී. ඇෆ්. බිලාසේ මහතා 1958 අගෝස්තු 1 වැනි හා 2 වැනි දිනයන්හි, බදුල්ල-හල්දුම්මුල්ල, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා බදුල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්.70ඒ/51.

සී. බී. වල්ගම්පාය මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, පී. එන්. බකෝලම්යුස් මහතා 1958 අගෝස්තු 28 වැනි දින පටන් 31 වැනි දින දක්වා, නුවරඑලියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, නුවරඑළියේ, අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට, නුවරඑලියේ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, හා බදුල්ල-හල්දුම්මුල්ල අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 7බී/56.

එල්. එච්. ද අල්විස් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. අමරසිංහ මහතා 1958 අගෝස්තු 1 වැනි දින පටන් 4 වැනි දින දක්වා, හම්බන්තොට අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, තංගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා තංගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේජ්ජ්. 49/48.

කේ. එස්. රාජේන්ද්‍රම් මහතා 1958 සැප්තැම්බර් 25 වැනි දින, පේදුරු තුඩුවේ දිස්ත්‍රික් උසාවියේ අංක 5,815 නඩුව ඇහීමට, පේදුරුතුඩුවේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 34ඒ/48.

එස්. එස්. කුලතිලක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. වී. එස්. ද සිල්වා මහතා 1958 ජූලි මස 30 වැනි දින, කුරුණෑගල අතිරේක මහෙස්ත්‍රාත් හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා කුරුණෑගල, කනදුල්ල උසාවියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්.66ඒ/54.

සී. තනබාලසිංහම් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ටී. පී. සී. කැරන් මහතා 1958 ජූලි 30 වැනි දින පටන් 1958 අගෝස්තු 2 වැනි දින දක්වා, මීගමුවේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, මීගමුවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා මීගමුවේ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය: ජේජ්ජ්.10/48.

සී. ඒ. එල්. කොරෙයා මහතා 1958 සැප්තැම්බර් 25 වැනි දින, හලාවත මහෙස්ත්‍රාත් උසාවියේ අංක. 22,487 නඩුව ඇහීමට, හලාවත අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට, හා හලාවත අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 68සී/51.

සී. වී. උඩලාගම මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ටී. ජේ. සී. පීරිස් මහතා 1958 අගෝස්තු 4 වැනි දින, පානදුරේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා පානදුරේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : පීඑල්/අයි 4/52.

ජේ. ඊ. ඉලංගන්තිලක මහතා නැති අතර, එස්. එච්. අබ්දුල් කාදර් මහතා 1958 අගෝස්තු 4 වැනි දින, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැළඩවිලි හත්පත්තුවේ හා හිරියාල හත්පත්තුවේ ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පී/එල්/ඇෆ්.1/56.

ජී. එල්. එම්. ප්‍රනාන්දු මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ඩී. සේරසිංහමහතා 1958 ජූලි 25 වැනි, 26 වැනි, 28 වැනි, 30 වැනි හා 31 වැනි දිනවල, තංගල්ල දිස්ත්‍රික්කයේ, බටහිර ගිරුව පත්තුවේ ගම්බද උසාවියේ, සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එච්.2/48.

ජී. එස්. හේරට් ගුණරත්න මහතා නැති අතර, එම්. ඒ. ඊ. බී. පෙරේරා මහතා 1958 ජූලි 31 වැනි දින, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පල හත්පත්තුවේ හා දඹදෙනිය හත්පත්තුවේ, ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීජ්ජ්.එම්අයිඑස්සී/57.

එම්. ඒ. ඊ. බී. පෙරේරා මහතා 1958 අගෝස්තු 1 වැනි දින පටන් 30 වැනි දින දක්වා, හෝ නැවත නියමයක් කරන තුරු, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, තමන්කඩුව පලාත හා කලගම් පලාත, ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට, හා හුරුළු පලාතේ ගම්බද උසාවියේ, අතිරේක සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/අයි.3/48.

ඩබ්ලිව්. බී. ඉඹුල්දෙණිය මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, පී. එස්. මහලේකම මහතා 1958 ජූලි 28 වැනි, 30 වැනි හා 31 වැනි දිනවල හා 1958 අගෝස්තු 1 වැනි දින, මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර, උඩ පලාත, උඩ බුලත්ගම හා යටිනුවර ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/යූ.3/50.

ඩබ්ලිව්. ජී. උඩුගම මහතා නැති අතර, ඩබ්ලිව්. ඩයස් ද සිංහ මහතා 1958 ජූලි 31 වැනි දින, මහනුවර දිස්ත්‍රික්කයේ, උතුරු මාතලේ ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට හා නැගෙනහිර මාතලේ ගම්බද උසාවියේ අතිරේක සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/කේ.5/48.

කේ. පී. ඩී. ඊ. කෝදගොඩ මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, සී. බී. ද සිල්වා මහතා 1958 අගෝස්තු 4 වැනි හා 5 වැනි දිනයන්හි, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නුවරගම් පලාතේ නැගෙනහිර හා බටහිර ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/පී. 6/51.

එස්. ජී. පීරිස් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, සී. වී. පතිරණ මහතා 1958 අගෝස්තු 8 වැනි හා 9 වැනි දිනයන්හි, මාතර දිස්ත්‍රික්කයේ, මොරවක් කෝරලේ, ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට හා වැලිගම් කෝරලේ හා ගහබඩ පත්තුවේ, ගම්බද උසාවියේ අතිරේක සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ආර්.4/50.

එස්. ටී. රාජරත්නම් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එන්. එහම්පරම් මහතා 1958 අගෝස්තු 6 වැනි දින පටන් 9 වැනි දින දක්වා, යාපන දිස්ත්‍රික්කයේ, දූපත් හා බටහිර වලිකාමම් ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/වී.1/48.

එස්. වේලමුරුගු මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ටී. මයිල්වාගනම් මහතා 1958 ජූලි 30 වැනි දින පටන් 1958 අගෝස්තු 2 වැනි දින දක්වා, වවුනියාවේ හා මන්නාරම් දිස්ත්‍රික්කවල, දකුණු වවුනියාවේ ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට, හා මාන්තයි ගම්බද උසාවියේ අතිරේක සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඒ.5/53.

ඒ. බී. අළුවිහාරේ මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. සේනානායක මහතා 1958 ජූලි 28 වැනි දින හා 1958 අගෝස්තු 2 වැනි දින, අවිස්සාවේල්ල දිස්ත්‍රික්කයේ, දෙහිගම්පල් කෝරලේ, පහල බුලත්ගම, අතුළුගම් හා පනාවල් කෝරලවල, ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට හා බෙලිගල් හා කුරුවිටි කෝරලවල ගම්බද උසාවියේ අතිරේක සභාපති වශයෙන් වැඩ බැලීමට.

එස්. ආර්. විජේයතිලක.
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්,

1958 අගෝස්තු 1 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කායර්‍යාලය,
තැ. පෙ. අංකය 573,
කොළඹ 12.

# වෙනත් පත් කිරීම්

**1958 අංක 346**

ලංකා සිවිල් සේවාවේ පහත සඳහන් පත්වීම් පහත දක්වා ඇති දිනවල පටන් වලංගු වේ :—

අංකය : 74/2/3 (එම්. එෆ්.)

ආර්. ඩී. පී. පවුලස් මහතා 1958 ජූලි මස 28 වෙනි දින පටන් ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ සහකාර ලේකම් වශයෙන්.

අංකය : 74/2/78 (එම්. එෆ්.)

එන්. ඩී. ජයවීර මහතා 1958 ජූලි මස 7 වෙනි දින පටන් බදුල්ල පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ විධානය පිට එකී දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්ත වරයා වශයෙන් කටයුතු කිරීමට.

1958 අගෝස්තු මස 4 වෙනි දින,

මුදල් අමාත්‍යාංශය,
කොළඹ 1.

එච්. ඊ. පීරිස්,
වැඩබලන භාණ්ඩාගාරයේ ලේකම්.

---

**1958 අංක 347**

1944 අංක 13 දරණ ආඥාපණතින් සහ 1948 පෙබරවාරි 5 වන දින අංක 9,828 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකරනලද 1948 පෙබරවාරි 4 වන දින දරණ ප්‍රකාශනයෙන් සංශොධිත, 1939 අංක 48 දරණ ළමයින් සහ බාල වයස්කාරයින් පිළිබඳ ආඥාපණතේ 3 වන වගන්තිය යටතේ, ගරු අධිකරණ ඇමතිතුමා විසින් පහත සඳහන් වන අධිකරණ නිලධාරීන් ඔවුන් දැනට දරණ ධුරවල සිටින කාලය තුළදී, ඔවුන්ගේ අනික් රාජකාරි වලට අතිරේක වශයෙන් ළමයින්ගේ මහෙස්ත්‍රාත්වරයින් ලෙස පත්කරනු ලැබේ :—

1. එස්. එන්. රාජදුරෙයි මහතා, ජේරුවර තුඩුව අධිකරණ කොට්ඨාශයට, 1958 අගෝස්තු මස 1 වන දින සිට.
2. ටී. එම්. කුමාරස්වාමි මහතා, ත්‍රිකුණාමලය අධිකරණ කොට්ඨාශයට, 1958 අගෝස්තු මස 1 වන දින සිට 1958 අගෝස්තු මස 26 වන දින තෙක්.
3. අයි. එම්. ඉස්මයිල් මහතා, අවිස්සාවේල්ල අධිකරණ කොට්ඨාශයට, 1958 අගෝස්තු මස 1 වන දින සිට.

ජී. සී. ටී. ඒ. ද සිල්වා,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන ස්ථාවර ලේකම් තැන.

1958 අගෝස්තු මස 2 වන දින,
කොළඹදීය.

---

**1958 අංක 348**

අංකය : ඒ.අයි.11/1/58.

ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ 16 වෙනි පරිච්ඡේදයේ 120 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ ඇමතිතුමා විසින්—

1958 ජූලි මස 20 වෙනි දින සිට මන්නාරම් දිස්ත්‍රික්කයේ මන්නාරම සහ මුසලි යන කොට්ඨාශවල ආදයම් පාලක ධුරයන්හි වැඩබලන කාලය තුල එම කොට්ඨාශවල හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට ටී. සැමුවෙල් තම්බයියා මහතාද,

1958 ජූලි මස 20 වෙනි දින සිට මන්නාරම් දිස්ත්‍රික්කයේ මන්තායි කොට්ඨාශයේ ආදයම් පාලක ධුරයෙහි වැඩබලන කාලය තුල එම කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට එන්. වේදරානේයසියොන් මහතාද,

1958 ජූලි මස 23 වෙනි දින සිට කේ. එම්. පෙරේරා මහතා නැවත වැඩ භාරගන්නාතුරු කොළඹ දිස්ත්‍රික්කයේ බටහිර සියනෑ කෝරළයේ මැදපත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට ඩී. ඒ. එස්. අලගියවන්න මහතාද,

1958 ජූලි මස 27 වෙනි දින සිට බී. කේ. ඩී. රපියෙල් අප්පුහාමි මහතා නැවත වැඩ භාරගන්නා තුරු හලාවත දිස්ත්‍රික්කයේ යාගම් පත්තුවේ මාදම්පේ උප කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට ඊ. පී. වික්‍රමසිංහ මහතාද,

1958 ජූලි මස 27 වෙනි දින සිට ඇස්. බී. දෙළන්ගහවත්ත මහතා නැවත වැඩ භාරගන්නා තුරු බදුල්ල දිස්ත්‍රික්කයේ උඩුකිඳ කොට්ඨාශයේ යටිපළාත සහ මැදපළාත යන කෝරළවල හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට පී. බී. රත්නායක මහතාද,

1958 ජූලි මස 28 වෙනි දින සිට හලාවත දිස්ත්‍රික්කයේ ගල්මුරුව කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයට එස්. එන්. හේරත් මහතාද,

1958 ජූලි මස 31 වෙනි දින සිට එම්. ඩබ්ලිව්. ප්‍රනාන්දු මහතා නැවත වැඩ භාරගන්නා තුරු කොළඹ දිස්ත්‍රික්කයේ මොරටුවේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට එම්. ඩී. එස්. ජයවර්ධන මහතාද,

1958 අගෝස්තු මස 3 වෙනි දින සිට පී. ඒ. වනසිංහ මහතා නැවත වැඩ භාරගන්නා තුරු බදුල්ල දිස්ත්‍රික්කයේ පස්සර කෝරළයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට ඩබ්ලිව්. වී. හිඟුරුකඩුව මහතාද,

1958 අගෝස්තු මස 3 වෙනි දින සිට කේ. පී. එස්. විජේතුංග මහතා නැවත වැඩ භාරගන්නා තුරු බදුල්ල දිස්ත්‍රික්කයේ රිල්පොල සහ බෝගොඩ යන කෝරළවල හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට පී. බී. රත්නායක මහතාද,

1958 අගෝස්තු මස 4 වෙනි දින සිට විල්මට් තල්දෙන මහතා නැවත වැඩ භාරගන්නාතුරු බදුල්ල දිස්ත්‍රික්කයේ ඔයපළාත කෝරළයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට ටී. බී. තල්දෙන මහතාද,

1958 අගෝස්තු මස 4 වෙනි දින සිට කේ. බී. මඩුගල්ල මහතා නැවත වැඩභාරගන්නා තුරු මඩකලපු දිස්ත්‍රික්කයේ බිම්තැන්න පත්තුවේ ආදයම්පාලක ධුරයෙහි වැඩ බලන කාලය තුල එම පත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට එක්ස්. එම්. සෙල්ලතම්බු මහතාද පත්කර ඇත්තේය.

ජී. සී. ටී. ඒ. ද සිල්වා,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන ස්ථිර ලේකම්.

1958 අගෝස්තු මස 5 වෙනි දින,
කොළඹ අධිකරණ අමාත්‍යාංශයේදීය.

---

**1958 අංක 349**

ගංගොඩවිල අප්පුහාමිල්ලාගේ ගිරිගෝරිස් පෙරේරා වික්‍රමසිංහ මහතා වරාගොඩ වාසස්ථානය සහ කාර්යාලයද පෑලියගොඩ අතුරු කාර්යාලයද ඇතුව කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් පත්කර තිබේ.

එස්. සී. ප්‍රනාන්දු,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1958 ජූලි මස 28 වෙනි දින,
කොළඹ දීය.

---

# ආණ්ඩුවේ නිවේදන

## 1956 අංක 46 දරණ පශු ශල්‍ය වෛද්‍යවරුන් හා පශු වෛද්‍ය කර්මයෙහි නියුක්ත වූවන් පිළිබඳ පනත

1956 අංක 46 දරණ පශු ශල්‍ය වෛද්‍යවරුන් හා පශු වෛද්‍ය කර්මයෙහි නියුක්තවූවන් පිළිබඳ පණතේ 10 (1) වැනි වගන්තියෙන් මා වෙත ලැබී ඇති බලතල අනුව, කෘෂිකර්ම හා ආහාර ඇමති වූ දෙන් පිලිප් රූපසිංහ ගුණවර්ධන වන මම පශු වෛද්‍ය මණ්ඩලය මගින් ලියා පදිංචි කිරීමේ නිලධාරියෙකු පත්කරනතුරු, 1958 ජූලි 7 වැනිද සිට වැඩබලන නියෝජ්‍ය අධ්‍යක්ෂක (සත්ව පාලනය) සහ ප්‍රධාන පශු ශල්‍ය වෛද්‍ය නිලධාරි තැන්පත් ඒ. අමරසිංහ මහතා ලියාපදිංචි කිරීමේ නිලධාරි තැන වශයෙන් මෙයින් පත් කරමි.

ඩී. පී. ආර්. ගුණවර්ධන,
කෘෂිකර්ම හා ආහාර ඇමති.

1958 අගෝස්තු මස 4 වැනිද,
කොළඹ, යූනියන් පෙදෙසේ කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේදී ය.

---

## 1946යේ ලංකා පාර්ලිමේන්තු මැතිවරණ පිළිබඳ රාජසභා නියෝගය

1952කේ අංක 7 දරණ ලංකා පාර්ලිමේන්තු මැතිවරණ සංශොධන පනතින් සංශොධිතවූ, 1946යේ ලංකා පාර්ලිමේන්තු මැතිවරණ පිළිබඳ රාජසභා නියෝගයේ 18 (1) වැනි වගන්තියෙන් මාවෙත පැවරී ඇති බලතල අනුව, පාර්ලිමේන්තු මැතිවරණ කොමසාරිස් තැන්පත් එඩ්වින් ෆීලික්ස් ඩයස් අබේසිංහ වන මම, 1958ටේ ඡන්ද දායක නාම ලේඛන සංශොධනය සඳහා ඉහත සඳහන් වගන්තියෙන් සකස්කිරීම අවශ්‍යවී තිබෙන ලැයිස්තු, සියළුම මැතිවරණ දිස්ත්‍රික්කවල ලියා පදිංචි කිරීමේ නිළධාරීන් විසින් සම්පූර්ණ කළයුතු අවසාන දිනය, 1958 නොවැම්බර් 29 වෙනි දින බවට, මෙම දැන්වීමෙන් නියම කරමි.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
පාර්ලිමේන්තු මැතිවරණ කොමසාරිස්.

1958 අගෝස්තු 4 වැනි දින,
කොළඹ දීය.

**ලංකාවේ ලියාපදිංචි කරන ලද නැව් සමාගම් පවත්වාගෙන ගොස් තිබෙන්නේ කොයි ආකාරයටද, ලංකාවේ නැව් කර්මාන්තය දියුණු කළ යුතු විධි මොනවාද යනු සොයා බැලීම සඳහා ගරුතර අග්‍රාණ්ඩුකාරතුමා විසින් පත් කරන ලද කොමිෂන් සභාව**

මෙහි පහත සඳහන් විසඳියයුතු කරුණු පරීක්ෂා කර බැලීම සඳහා සර් ඇඩ්වර්ඩ් ජෝර්ජ් පෙරේරා ජයතිලක (සභාපති), රොනල්ඩ් චාර්ලස් බෙන් බ්‍රිජ්, හියුබට් රිච්මන්ඩ් කෙම්ප්, මැසාෂී ඔයාමා, නානායක්කාර පතිරගේ සොලමන් පෙරේරා යන මහතුන් ගෙන් සමන්විත කොමිෂන් සභාවක් පත් කිරීමට ගරුතර අග්‍රාණ්ඩුකාරතුමා ස්වකීය කැමැත්ත ප්‍රකාශ කර තිබේ :—

1. ලංකාවේ ලියා පදිංචි කරන ලද නැව් සමාගම් විසින් ස්වකීය කාර්‍යයන් කරගෙන ගොස් තිබෙන්නේ කොයි ආකාරයටද යනු පරීක්ෂා කර බැලීමේදී මෙහි පහත සඳහන් කරුණු ගැන විශෙෂයෙන් සළකා බැලිය යුතුයි.
   - (අ) පාලනය, මිලමුදල් යෙදීම, බඩු පැටවීමට ඉඩ කඩ වෙන් කරවා ගැනීම හා නැව් කුළියට ගැනීම, මතුවට වෙන් කර තැබීම් සහ නැව් අත්කර ගැනීම් ද ඇතුළත් ක්‍රියා පටිපාටියේ කාර්‍යක්ෂමභාවය.
   - (ආ) කොටස්කරුවන් සම්බන්ධයෙන් ඉටු වියයුතු යුතුකම් ඉටු කිරීම,
   - (ඇ) ලංකාණ්ඩුව වෙනුවෙන් කළයුතු යැයි භාරගත් යම්කිසි යුතුකම් කොටසක් වේ නම්, එය ඉටු කිරීම සහ,
2. පහත සඳහන් කරුණුවලට වෙසෙසින් අදාළවන පරිදි ලංකාවේ වෙළඳ නැව් කර්මාන්තය දියුණු කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම :—
   - (අ) විදේශීය විශෙෂඥයන් ලබා ගැනීම හා ලාංකිකයන් පුහුණු කිරීම ඇතුළු නැව් කර්මාන්ත පාලනය,
   - (ආ) මිශ්‍ර මුදල් යෙදීම,
   - (ඇ) නැව් ලබාගැනීම,
   - (ඇ) නැව් කුළියට ගැනීම,
   - (ඉ) ලංකා නැව් කර්මාන්තය දියුණු කරලීම සඳහා ආණ්ඩුව හා පෞද්ගලික අංශය වෙනුවෙන් දිය හැකි උසස්ම ආධාර මොනවාද යන වග,
   - (ඊ) දනට ලියාපදිංචි කර තිබෙන නැව් සමාගම් මගින් එහි දියුණුව සඳහා කෙරෙන වැඩට කෙසේ ආධාර දිය යුතුද යන වග,
   - (උ) මුදල් ගෙවීම් යුක්ති සහගත අන්දමින් සිදු කෙරෙන අතරම ලංකාවේ නැව් කර්මාන්තය නගා සිටුවීමට උපකාර කිරීමක් වශයෙන් ආණ්ඩුවේ බඩු මුට්ටු මුහුදේ ගෙනයාම කෙසේ කළයුතුද යන වග,
   - (ඌ) එ වැනි සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් රජයේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම නිසැක කර ගැනීම සඳහා අවශ්‍ය පාලන තන්ත්‍රය,
3. ඉහතින් සඳහන් පරිදි කොමිෂන් සභාවේ විෂය නිර්දේශ හා සම්බන්ධ යම් කරුණක් මත හෝ කරුණු හැමෙකක් ම මත හෝ ඉදිරිපත් කිරීමට සහ/නැතහොත් සැපයීමට කරම් කරුණු ඇති හැම කෙනෙකුගෙන්ම, 1958 අගෝස්තු 14 වැනිදට හෝ ඊට පෙර හෝ පහත අත්සන් කරන අයට ඒ බව දන්වීමටත්, 1958 අගෝස්තු 25 වැනිදට හෝ ඊට පෙර හෝ එය ලියා යැවීමටත් මින් ඉල්වා සිටිනු ලැබේ. ඉදිරිපත් කරන කරුණු පිටපත් හය බැගින් සැපැයිණි නම් හොඳනේය ; තනි පිටේ ටයිප් ගැසිණි නම් වඩාත් අගනේය.
4. කොමිෂන් සභාව කැමැති පරිදි, අනතුරුව, ප්‍රසිද්ධියේ හෝ රහසිගතව හෝ සාක්ෂ්‍ය විභාගද පැවැත්වෙනු ඇත.

කොමිෂන් සභාවේ අණ පරිදි,
සී. එච්. ජේ. අමරතුංග,
ලේකම්.

ලංකා නෞකා ගමන වග විභාග කොමිෂන් සභා කාර්යාලය,
ගෝල්පේස් කෝට් 2, කොළඹ 3.
1958 අගෝස්තු 1වෙනි දින,ප්ලැට් නො. 53,

---

## 4 ඒ පෝර්මය

### 1949 නො. 3 දරණ ඉන්දියානු සහ පාකිස්තානි නිවැසි (පුරවැසි) පණත

**පනතේ දහවැනි වගන්තිය යටතේ දන්වීමයි**

ඉන්දියානු සහ පාකිස්තානි වාසීන් ලියාපදිංචිකිරීමේ වැඩබලන කොමසාරිස් තැන්පත් වික්ටර් ජෝශප් හැරල්ඩ් ගුණසේකර වන මා, 1949 නො. 3 දරණ ඉන්දියානු සහ පාකිස්තානි නිවැසි (පුරවැසි) පණතේ දහවැනි වගන්ති යටතේ දැනුම් දී සිටින්නේ පහත සඳහන් උපලෙඛනයේ දක්වන සෑම ඉල්ලුම්පත්‍රයක්ම එකී පණතේ 4 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය යටතේ අනුමතකිරීමට යම්කිසි මහජනයෙකුගේ විරුද්ධතාවයක් ඇත් නම්, කුමන කාරණා නිසා එවැනි විරුද්ධතාවය මුල් කරගනු ලැබී ද යනු සඳහන් ලිපියක් මෙම දන්වීම ප්‍රසිද්ධ කළ දින සිට මාසයක් තුල දී නොලැබුනි නම් ඒ සෑම ඉල්ලුම්පත්‍රයක්ම අනුමතකරන බවයි.

විරුද්ධවන සෑම අයකුගේ සම්පූර්ණ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල සෑම විරුද්ධවීමේ නිවේදනයකම ඇතුළත් විය යුතුයි.

වී. ජේ. එච්. ගුණසේකර,
ඉන්දියානු සහ පාකිස්තානි වාසීන් ලියා පදිංචිකිරීමේ
වැඩබලන කොමසාරිස් තැන.

1958 වූ අගෝස්තු මස 5 වැනි දින
කොළඹදීය.

### උපලෙඛනය

| ඉල්ලුම්පත්‍රයෙහි නොම්මරය සහ දිනය | | ලංකාවේ පුරවැසියෙකු වශයෙන් ලියාපදිංචි කිරීමට අයැද සිටින ඉල්ලුම් කරුගේ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල |
|---|---|---|
| L 2160—6.3.51 | .. | මුත්තයියා මුරුගයියා, මුත්තයියා කන්කානම බාරේ, ලෙමගස්තැන්න කොටස, ඩාප්‍රි වතුයාය, ගම්පොල |
| L 2939—17.2.51 | .. | නඩෙසන් පලනිමුත්තු, ගලමුදුන වතුයාය, දෙලොස්බාගේ |
| L 4095—5.6.51 | .. | කදිරවේළු මුත්තාල්, මරියාවත්ත වත්ත, ගම්පොල |
| L 5598—25.6.51 | .. | කදිර්වේල් මුත්තයියා, ඕරියන් වත්ත, ගම්පොල |
| L 6675—24.5.51 | .. | ආන්ඩි කන්දන්ගේ වැන්දඹුව වූ අන්ගම්මාල්, පරගල්ල වත්ත, නාවලපිටිය |
| L 9834—28.7.51 | .. | රාමසියාගේ පුතා සේදන් නොහොත් රාසු, ගලමුදුන වතුයාය, දෙලොස්බාගේ |
| L 10013—4.7.51 | .. | වෙල්ලයියන් පෙරුමාල්, කැටරම් වත්ත, දෙළොස්බාගේ |
| L 10154—22.7.51 | .. | මදලමුත්තු රපියෙල්, සැන්කුහාර් වත්ත, ගම්පොල |
| I 607/L—3.3.51 | .. | නාගලිංගම්පිල්ලෙයි සිදම්බරතම්මාල්, එච්. ජී. පීටර් සිල්වා බාරේ, පරගල්ල වත්ත, නාවලපිටිය |
| N 4931/I/L—7.4.51 | .. | සුප්පයියා මාරියායි, බර්තගල්ල වත්ත, නාවලපිටිය |
| P 8488—6.5.51 | .. | මරුදනායගම් රාමයියා, අග්‍ර එල්බැද්ද වත්ත, අග්‍රපතන |
| R 1746—14.4.51 | .. | වීරන් නාගම්මා, කැල්සේවත්ත, නානුඔය |
| R 1773—14.4.51 | .. | මුරුගන් පෙරියන්නන්, කැල්සේ වත්ත, නානුඔය |
| R 4499—18.6.51 | .. | මරුදෙයි පෙරියසාමි, කැල්සේ වත්ත, නානුඔය |
| R 4456—18.6.51 | .. | මරුදමුත්තුගේ වැන්දඹුව වූ නයිලම්මායි, කැල්සේ වත්ත, නානුඔය |
| R 4721—18.3.51 | .. | රාමසාමි ලෙච්චුමන්, මහගස්තොට වත්ත, නුවරඑළිය |
| R 6228—2.8.51 | .. | මුත්තන් තෙයිවානෙයි, වන්ගිඔය වත්ත, නානුඔය |
| T 496—24.6.51 | .. | නඩරාජා ඩේසිගර් තිරුඥානසම්බන්ද ඩේසිගර්, මාදගල් |

| ඉල්ලුම්පත්‍රයෙහි නො. සහ දිනය | | ලංකාවේ පුරවැසියෙකු මෙන් ලියාපදිංචිකිරීමට අයැද සිටින ඉල්ලුම්කරුගේ නම සහ ලිපුම් ලැබෙන පිළිවෙල |
|---|---|---|
| U 801—28.2.51 | .. | මාදසාමි රෝසම්මා, උඩපොල වතුයාය, පොල්ගහවෙල |
| U 831—15.3.51 | .. | මුරුගප්ප සින්නසාමි, බුලත්ඇල්ල වත්ත, කටුගම්පොළ |
| U 1951—27.7.51 | .. | අන්ගප්පන් මානික්කම්, පලුකුඹල්පොල, මල්පිටිය, කුරුණෑගල |
| W 973—15.1.51 | .. | සොල්ලමුත්තු සින්නයියා, ස්ට්‍රැන්ඩන් වත්ත, ඇල්ල |
| Y 4692/W—23.6.51 | .. | කරුප්පයියා මාරිමුත්තු, ඉහළ කොටස, ඇල්ලවත්ත වත්ත, ඇල්ල |
| X 6217—26.7.51 | .. | පොන්නයියා ලෙච්චුමන්, සාන්ත කැතරින් කොටස, නයාබැද්ද වත්ත, බන්ඩාරවෙල |
| BB 7759—4.8.51 | .. | පළනිමුත්තු ලෙච්චුමි, බැල්වින් කොටස, හැදර්ලේ වතුයාය, රක්වාන |

---

## 4බී පෝර්මය

### 1949 නො. 3 දරණ ඉන්දියානු සහ පාකිස්තානි නිවැසි (පුරවැසි) පණත

**පණතේ දහවැනි වගන්තිය යටතේ දැන්වීමයි**

ඉන්දියානු සහ පාකිස්තානි වාසීන් ලියාපදිංචි කිරීමේ වැඩබලන කොමසාරිස් තැන්පත් වික්ටර් ජෝසප් හැරල්ඩ් ගුණසේකර වන මා, 1949 නො. 3 දරණ ඉන්දියානු සහ පකිස්තානි නිවැසි (පුරවැසි) පණතේ දහ වැනි වගන්තිය යටතේ දනුම් දී සිටින්නේ පහත සඳහන් උප ලෙඛනයේ දක්වන සෑම ඉල්ලුම් පත්‍රයක්ම එකී පණතේ 4 වැනි වගන්තියේ 1 වැනි සහ 2 වැනි උප වගන්ති යටතේ අනුමත කිරීමට යම්කිසි මහජනයෙකුගේ විරුඬතාවයක් ඇත්නම් කුමන කාරණා නිසා එවැනි විරුඬතාවය මුල්කරගනු ලැබිද යනු සඳහන් ලිපියක් මෙම දැන්වීම ප්‍රසිඩකළ දින සිට මසක් තුළදී නොලැබුනි නම් ඒ සෑම ඉල්ලුම් පත්‍රයක්ම අනුමත කරන බවයි.

විරුඬවන සෑම අයෙකුගේම සම්පූර්ණ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල සෑම විරුඬවීමේ නිවේදනයකම ඇතුළත් විය යුතුයි.

වී. ජේ. එච්. ගුණසේකර,
ඉන්දියානු සහ පාකිස්තානි වාසීන් ලියාපදිංචි කිරීමේ වැඩබලන කොමසාරිස් තැන.

1958 අගෝස්තු මස 5 වෙන දින,
කොළඹදීය.

### උපලෙඛනය

| ඉල්ලුම්පත්‍රයෙහි නොම්මරය සහ දිනය | | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචි කිරීමට අයැද සිටින ඉල්ලුම්කරුගේ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචි කිරීමට ඉල්ලුම් කරන අයගේ නමත් සමග ලියාපදිංචි කිරීමට අයැද සිටින අන්‍ය අයකුගේ නම සහ ඉල්ලුම්කරුට ඇති සම්බන්ධකම |
|---|---|---|---|
| H 6239 | .. | අරුලානන්දු සවරිමුත්තු, ලියන්ගල්ල කොටස, ලෙබනන් වතුයාය, මඩුල්කැලේ | ජෙබමාලෙයි නොහොත් සෝමාලෙයි (භායයාව), එලිසබත් නොහොත් එලිසම්මාල් (දුව), ඥාන සවුන්දරි (දුව), වේදකන්නු (පුතා), සෙබස්තියන් නොහොත් බාලන්තෝනි (පුතා), සින්නප්පන් (පුතා), මෝචමේරි (දුව) |
| L 2903—17.2.51 | .. | පේයන් ආනෙයිකුට්ටි, ගලමුදුන වතුයාය, දෙලොස්බාගේ | පිච්චෙයි (භායයාව), නාගලින්ගම් නොහොත් සුප්පයියා (පුතා), පන්ජවර්නම් නොහොත් රාක්කි (දුව), සති (දුව), සීතා (දුව), තිරුපති (දුව), පාර්වති (දුව), සතියසීලන් (පුතා), කනේසන් (පුතා) |
| N 5349—8.5.51 | .. | සුප්පන් රාමන්, ඉහළ කොටස, විස්පනේවත්ත, කොත්මලේ | මුනියම්මා (භායයාව), අලගන් නොහොත් තන පාලන් (පුතා), කුප්පසාමි (පුතා), ලෙච්චුමන් (පුතා), අලමේලු (දුව), සුප්පන් (පුතා) |
| O 349—12.11.50 | .. | අම්බන් මානික්කම්, සාන්ත මාගරට් වත්ත, උඩපුස්සැල්ලාව | මුත්තු (පුතා) |
| O 387—3.12.50 | .. | අලගන් කරුප්පයියා, සාන්ත මාගරට් වත්ත, උඩපුස්සැල්ලාව | මාරියායි (භායයාව), සෙල්වරත්නම් නොහොත් වෙල්වරතනම් (පුතා), දුරෙසිරාජ් නොහොත් පන් නීර්සෙල්වම් (පුතා) |
| O 398—3.12.50 | .. | මරුදමුත්තු සෙන්ගන්, සාන්ත මාගරට් වත්ත, උඩපුස්සැල්ලාව | නල්ලම්මා (භායයාව), මාරියායි නොහොත් මාරි අම්මා (දුව), පුන්ගාවනම් (දුව), රාමලිංගම් නොහොත් රාසලිංගම් (පුතා), සිවපාකියම් (දුව), රාසමනී (දුව) |
| O 1193—8.10.50 | .. | සුප්පන් සුප්පන්, මැද කොටස, බෙල්මාර් වත්ත, හල්ග්‍රන්ඔය | ලෙච්චුමි (භායයාව), සෙවනු (පුතා), අම්බිගාවතී නොහොත් තන්ගවේල් (පුතා), රත්නම් නොහොත් නවරත්නම් (පුතා), සූරනම් (දුව), කාලිඅම්මා (දුව) |
| O 1209—8.10.50 | .. | සුබ්‍රමානියන් රාමසාමි, මැද කොටස, බෙල්මාර් වත්ත, හල්ග්‍රන්ඔය | කදිරායි (භායයාව), ලෙච්චුමි නොහොත් වේලායි (දුව), වේලයුදන් නොහොත් රාසු (පුතා), රාම නාදන් (පුතා), දෙරෙයිසාමි (පුතා), කන්දසාමි (පුතා), රාසමනි නොහොත් රාසම්මා (දුව) |
| O 1228—8.10.50 | .. | මාරිමුත්තු සින්නයියා, මැද කොටස, බෙල්මාර් වත්ත, හල්ග්‍රන්ඔය | ආචි (භායයාව), දෙරෙයිරාජ් නොහොත් නාරායනන් (පුතා), විජයලෙච්චුමි නොහොත් සාලාච්චි නොහොත් බාලමනි (දුව), රාමනාදන් නොහොත් රාමයියා (පුතා), රත්නම් නොහොත් මුත්තු (පුතා), ඉන්ද්‍රානි නොහොත් රාසමනි (දුව), සාමිනාදන් නොහොත් සෙල්වම් (පුතා) |
| O 1314—8.10.50 | .. | පලනි මානික්කම්, මැද කොටස, බෙල්මාර් වත්ත, හල්ග්‍රන්ඔය | සින්නම්මාල් (භායයාව), අලගිරි නොහොත් අලගර් (පුතා), අලගු නොහොත් ආරායි (දුව), වේළු (පුතා) |
| O 1341—8.10.50 | .. | මුත්තුසාමි පෙරුමාල්, මැද කොටස, බෙල්මාර්වත්ත, හල්ග්‍රන්ඔය | කදිරායි (භායයාව), අන්නලෙච්චුමි (දුව), රාක්කු (දුව), විශ්වනාදන් (පුතා), සෙල්වනායගී (දුව), ජානකීඅම්මා (දුව), බාලක්‍රිෂ්නන් (පුතා), බාල යෝගිනි නොහොත් බාලරානි (දුව), පද්මනාදන් (පුතා), පාර්වතී (දුව) |

| ඉල්ලුම්පත්‍රයෙහි අංකය සහ දිනය | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචි කිරීමට අයැද සිටින ඉල්ලුම්කරුගේ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචි කිරීමට ඉල්ලුම් කරන අයගේ නමත් සමග ලියාපදිංචි කිරීමට අයැද සිටින අන්‍ය අයකුගේ නම සහ ඉල්ලුම්කරුට ඇති සම්බන්ධකම |
|---|---|---|
| O 1372—21.1.51 | .. කාලිමුත්තු කරුප්පයියා, අවුල්ටන් කොටස, වල්ඩෙමාර් වත්ත, උඩපුස්සැල්ලාව | රාමායි (භාර්යාව), සෙල්ලදුරෙයි (පුතා), සතිවේල් නොහොත් කාලිමුත්තු (පුතා), නාච්චි (දුව), සෙල්ලම්මාල් (දුව), සීදෙයි නොහොත් සීදෙයි අම්මා (දුව), අසෝකම්මාල් නොහොත් අස්වතම්මා (දුව) |
| O 1492—18.2.51 | .. සින්නසාමි සොක්කලිංගම්, ඉහළ කොටස, රාගල්ල වත්ත, හල්ගුන්ඔය | මුත්තාල් (භාර්යාව), නඩේසන් නොහොත් තන්ග වේල් (පුතා), ලෙච්චුමි (දුව), ෂන්මුගනාදන් (පුතා) |
| O 1712—28.1.51 | .. රාමසාමි මාරිමුත්තු, බ්ලෙයාර්ලොමන්ඩ් වත්ත, උඩපුස්සැල්ලාව | තවමනි නොහොත් වීරායි නොහොත් මාරි (දුව), ඉන්ද්‍රානි නොහොත් වේදන්ගායි (දුව) |
| O 1722—28.1.51 | .. වේලයුදම් කදිර්වේළු, බ්ලෙයාර්ලොමන්ඩ් වත්ත, උඩපුස්සැල්ලාව | කාමාච්චි (භාර්යාව), වේලායුදම් නොහොත් වේලසිදම් (පුතා), ලෙච්චිමි (දුව), පූපති නොහොත් පූවායි (දුව), තනලෙච්චුමි (දුව), අන්නාමි (දුව), වල්ලි අම්මා (දුව) |
| O 1735—28.1.51 | .. කදිරවේල් සොක්කලිංගම්, බ්ලෙයාර්ලොමන්ඩ් වත්ත, උඩපුස්සැල්ලාව | සිට්ටු (භාර්යාව), පොන්නුසාමි (පුතා), කුමාරවේල් (පුතා), මුත්තුසාමි (පුතා), පන්ජවර්නම් (දුව), පාර්වති (දුව) |
| O 1799—28.1.51 | .. සෙල්ලන් කදිර්වේළු, ඉහළ කොටස, බ්ලෙයාර්ලොමන්ඩ් වත්ත, උඩපුස්සැල්ලාව | රත්නම් (පුතා), සෙල්වරත්නම් නොහොත් සෙල්ව රාජ් (පුතා), පූලිංගම් (පුතා), සෙල්ලමනී (පුතා), |
| O 1956—11.2.51 | .. කාලන් කත්තක්කුත්, ඇම්හර්ස්ට් වත්ත, හල්ගුන්ඔය | මාරියායි (භාර්යාව), කූලිඅම්මාල් (දුව) |
| O 2047—18.2.51 | .. මුත්තුසාමි අඩෛයික්කලම්, ආන්වික් කොටස, බෲක්සයිඩ් වත්ත, උඩපුස්සැල්ලාව | ආනන්දම්මාල් (භාර්යාව), සෙල්වනායගී (දුව), රත්නමාලා (දුව) |
| O 2073—5.3.51 | .. මරුදමුත්තු කරුප්පයියා, වුල්ලෝස් වත්ත, උඩපුස්සැල්ලාව | සින්නම්මාල් (භාර්යාව), සෙල්ලම් නොහොත් සීදෙයි (දුව), සෙගප්පායි (දුව), ලෙච්චුමි (දුව), පාකියම් නොහොත් සිවපාකියම් (දුව) |
| R 2075—18.3.51 | .. සවරිමුත්තු මරියදාස්, මහගස්තොටවත්ත, නුවරඑළිය | ඥානම්මා (භාර්යාව), කුරුසු නොහොත් උපකාරම් (පුතා), අරුල්මේරි නොහොත් තෙරේසම්මා (දුව), රීතාමේරි නොහොත් රීතම්මාල් (දුව), ජෝශප් (පුතා), ජෙයමේරි නොහොත් ක්‍රිස්තිනා (දුව), ප්‍රැන්සිස් අම්මා (දුව) |
| O 2082—5.3.51 | .. කන්දන් මුත්තුකරුප්පන්, වුල්ලෝස් වත්ත, උඩපුස්සැල්ලාව | කමලායි (භාර්යාව), කාමාච්චි නොහොත් සුසිලා (දුව), පාර්වති (දුව), මීනාච්චි (දුව), පන්චවර්නම් (දුව), කිට්නාවනී (දුව) |
| O 2167—5.3.51 | .. කුලන්දවේල් ආවාදෙයි, වුල්ලෝස් වත්ත, උඩපුස්සැල්ලාව | වීරායි (භාර්යාව), වල්ලිඅම්මා නොහොත් ලෙච්චුමි (දුව), රාසු (පුතා), විසාලා නොහොත් පාකියම් (දුව), රාමසාමි (පුතා) |
| O 2566—18.2.51 | .. පෙරියන්නන් රාමන්, ඉහළ කොටස, රාගල්ල වත්ත, හල්ගුන්ඔය | පෙරියනායකී (භාර්යාව), ආරායි (දුව) |
| O 3790—20.5.51 | .. සින්නසාමි රාසු, ස්වැපඩ් වත්ත, හල්ගුන්ඔය ... | මුරුගායි (භාර්යාව), තන්ගාල් නොහොත් මුරුගායි නොහොත් මරුදායි (දුව), පොන්නයියා නොහොත් අන්නාවී (පුතා), කාලිඅම්මා නොහොත් වීරම්මා (දුව), සින්නම්මා (දුව) |
| O 4037—4.7.51 | .. මුත්තුසාමි අලගන් සින්නකරුප්පයියා, හරස්බැද්ද බසාර්, හරස්බැද්ද | සෙල්ලම්මා නොහොත් මාරියායි (භාර්යාව), අලගේසන් (පුතා), රාජලෙච්චුමි (දුව), රාජ කුලේන්ද්‍රම් (පුතා), කුමාරකුලසිංහම් නොහොත් රාජකුලසිංහම් (පුතා), රාජේන්ද්‍රන් (පුතා), රාජ තිලකම් (පුතා), රාජම්බාල් (දුව) |
| O 4529—14.7.51 | .. පලනියන්ඩි කදිර්වේළු, බංගලාව, බ්ලෙයාර්ලොමන්ඩ් වත්ත, උඩපුස්සැල්ලාව | තිරුවායි (භාර්යාව), පාකියනාදන් (පුතා), මහේස්වරී (දුව), එදයනාදන් නොහොත් එදියරාජා (පුතා) |
| O 6342—24.6.51 | .. වේළු කරුප්පයියා, දියනිල්ල කොටස, ලිඩෙස්ඩේල් වත්ත, හල්ගුන්ඔය | මාරියායි (භාර්යාව), රූසම්මා නොහොත් රාජාම්බාල් (දුව) |
| O 6383—20.5.51 | .. පෙරියසාමි මරුදෙයි, අංක 3, හයිපොරස්ට් වත්ත, කඳපොල | නල්ලම්මා (භාර්යාව), පුෂ්පම් නොහොත් මරුදායි (දුව) |
| O 6424—20.5.51 | .. වෙල්ලයන් කදිර්වේල්, අංක 3, හයි පොරස්ට් වත්ත, කඳපොල | කදිරායි (භාර්යාව), පාකියනාදන් නොහොත් වෙල්ලයන් (පුතා) |
| O 6457—20.5.51 | .. පොන්නන් වීරන්, අංක 3, හයි පොරස්ට් වත්ත, කඳපොල | සෙවන්දායි නොහොත් සාන්දායි (භාර්යාව), සිත්‍රායි (දුව), අන්නපූරනම් (දුව) |
| O 6481—24.6.51 | .. වෙල්ලයන් රාමන්, සිල්වර් කැන්ඩි වත්ත, බෲක්සයිඩ් | සීරන්ගී (භාර්යාව), පූවායි (දුව), ලෙච්චුමි (දුව), වේළු (පුතා) |

| ඉල්ලුම් පත්‍රයෙහි අංකය සහ දිනය | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචි කිරීමට අයැද සිටින ඉල්ලුම්කරුගේ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචි කිරීමට ඉල්ලුම් කරන අයගේ නමත් සමග ලියාපදිංචි කිරීමට අයැද සිටින අන්‍ය අයකුගේ නම සහ ඉල්ලුම්කරුට ඇති සම්බන්ධකම |
|---|---|---|
| O 2044—18.2.51 .. | මුත්තන් පෙරියසාමි, ආන්වින් වත්ත, උඩපුස්සැල්ලාව | රුක්මනි (භාර්යාව), මාරියායි (දුව), රාමායි (දුව), බාලක්‍රිෂ්නන් (පුතා), මල්ලියාවති (දුව) |
| O 6917—27.12.50 .. | රාක්කන් කරුප්පන්, ලිබෙස්ඩේල් වත්ත, හල්ගුන්ඔය | වල්ලිඅම්මාල් (භාර්යාව), පෙරිඅක්කාල් (දුව), තන්ගරාසු (පුතා), ජෙයමනි (දුව) |
| O 7240—8.7.51 .. | මුත්තුසාමි ගෝවින්දන්, රූපැහැකොක් වත්ත, උඩපුස්සැල්ලාව | පාකියම් (භාර්යාව), ලෙච්චුමි (දුව), කරුප්පයියා (පුතා), සිවපාකියම් (දුව), අමුර්තවල්ලි (දුව) |
| O 9167—25.7.51 .. | කරුප්පන් නොහොත් කරුප්පයියා ඌවන්, මහඌව වත්ත, හරස්බැද්ද | අන්ගායි (භාර්යාව), තෙයිවානෙයි නොහොත් කරුප්පායි (දුව), සෙවනායි (දුව), මරදම්මා (දුව), නාච්චායි (දුව), රාමායි (දුව), ලෙච්චුමි (දුව) |
| O 9172—25.7.51 .. | කදිර්වේල් වේළු, මහඌව වත්ත, හරස්බැද්ද ... | සිවනු (භාර්යාව), මුරුගයියා (පුතා), මාරියායි (දුව), කිට්නසාමි (පුතා) |
| O 9174—25.7.51 .. | කොලන්දවේල් අරුනාසලම්, මහඌව වත්ත, හරස්බැද්ද | රාමායි (භාර්යාව), තෙයිවානෙයි නොහොත් ලෙච්චුමි (දුව), පාකියම් නොහොත් පාකියලෙච්චුමි (දුව), පලනියාන්දවන් (පුතා), සෙල්ලයියා (පුතා), තන්ගවේල් (පුතා), සීතාලෙච්චුමි (දුව) |
| O 9247—25.7.51 .. | අඩෙයික්කන් වීරප්පන්, මහඌව වත්ත, හරස්බැද්ද | සන්දනම් (භාර්යාව), ඩේවිඩ් නොහොත් ජෙබමාලෙයි (පුතා), පාකියම් නොහොත් තනපාකියම් (දුව), සන්දනම් (පුතා) |
| O 9281—25.7.51 .. | සෙවතියන් සූසෙයි, මහඌව වත්ත, හරස්බැද්ද ... | අම්මකන්නු (භාර්යාව), සන්දනම් (දුව), මාරිඅම්මා නොහොත් සෙවලායි (දුව), මුත්තු (පුතා), රාමලිංගම් (පුතා), ආරෝකියම් (පුතා), තනපාකියම් (දුව), ලෙච්චුමි (දුව) |
| O 9302—25.7.51 .. | මිරුදෙයි සින්නයියා, මහඌව වත්ත, හරස්බැද්ද ... | පෙරිඅම්මා (භාර්යාව), තවමනි නොහොත් තෙයිවානි (දුව), ජයලෙච්චුමි (දුව) |
| R 3742/O—20.5.51 .. | රෙන්ගන් පෙරුමාල්, අංක 3, නයි පොරස්ට් වත්ත, කඳපොල | වීරම්මා (භාර්යාව), රාසම්මා (දුව) රුක්මනි (දුව) |
| R 1589—18.3.51 .. | වෙම්බඩි ආන්ඩි, මහගස්තොට වත්ත, නුවරඑළිය ... | කාමාච්චි (භාර්යාව), තන්ගම්මා නොහොත් තන්ගා (දුව), වෙම්බඩි (පුතා), නාගමුත්තු (පුතා), රෙන්ගරාජ් නොහොත් රෙන්ගරාසු (පුතා), ලක්ෂ්මී (දුව) |
| R 1726—18.3.51 .. | අරුනාසලම් මලයලම්, මහගස්තොට වත්ත, නුවරඑළිය | කන්නිඅම්මා නොහොත් කුසිඅම්මා (දුව) |
| O 1714—28.1.51 .. | මාරිමුත්තු ෂන්මුගම්, බ්ලෙයාර්ලොමන්ඩ් වත්ත, උඩපුස්සැල්ලාව | සේදුනාම්බු (භාර්යාව), වේදන්ගන් නොහොත් සතාසිවම් නොහොත් තන්ගරාජා (පුතා), නඩේසන් නොහොත් නඩරාජා (පුතා), පලනියායි නොහොත් රානි (දුව), පාර්වති (දුව), පරමේෂ්වරි නොහොත් වේදන්ගායි (දුව), පාන්ඩියන් (පුතා), මහේස්වරි (දුව) |
| R 2053—18.3.51 .. | කදිරන් කොන්දන්, මහගස්තොට වත්ත, නුවරඑළිය | කන්දයි (භාර්යාව), සෙවනු (පුතා), තන්ගරාජා (පුතා), සෙල්වරාජා (පුතා), තනලෙච්චිමි (දුව) |
| R 2061—18.3.51 .. | ජාන් ක්ලාස් ලූර්දු, මහගස්තොට වත්ත, නුවරඑළිය | වේලන්ගනි (භාර්යාව), ජෙබමාලෙයි පිච්චෙයි (පුතා), මේරි නොහොත් තෙරේසම්මාල් (දුව), සෙබස්තියන් සූසෙයි (පුතා), මයිකල් (පුතා), තෝමමාරි (දුව), අන්තෝනිමේරි නොහොත් අන්තෝනිඅම්මා (දුව), අරුල්මේරි (දුව) |
| R 3718—22.4.51 .. | ආරුමුගම් පෙරියසාමි, නේස්බිවත්ත, නුවරඑළිය ... | මාරියායි (භාර්යාව), රාමායි නොහොත් නාගම්මා (දුව), වෙම්බඩි (පුතා), ඕමන්දු (පුතා), පෙරිඅක්කා (දුව) |
| R 6224—2.8.51 .. | මුත්තන් සින්නවීරන්, වන්ගිඔය වත්ත, නානුඔය ... | සුබ්‍රමානියම් (පුතා) |
| F 1542—2.4.51 .. | මරුදෙයි මායන්ඩි, ඉහළ කොටස, ගලහ වතුයාය, ගලහ | මුත්තු පේච්චි (භාර්යාව), ලෙච්චිමි (දුව), රාසයියා නොහොත් මුනියන්ඩි (පුතා), තියාගරාජා නොහොත් මායන්ඩි (පුතා), සෙල්වම් නොහොත් සූරියපුෂ්පම් (දුව), සරෝසා (දුව), බාල සරසුවති (දුව), පාර්වති (දුව) |
| U 2270—2.8.51 .. | සේගු සුලෙයිමන් හුසේන් අබ්දුල් කාදර්, ජමාලියා ස්ටෝර්ස්, 72, 74, බසාර් වීදිය, කුරුණෑගල | පතීමා (භාර්යාව), හුසිදර් අලි (පුතා), මොහමඩ් අබ්දුල් කාදර් (පුතා), අහමඩ් (පුතා) |
| BB 7143—4.8.51 .. | මීරා සාහිබ් මාදර් මොහිඩීන්, ඩැල්වින් කොටස, හැදර්ලේ වතුයාය, රක්වාන | නාගූර්අම්මා (භාර්යාව), මොහමඩ් සේන් (පුතා), පාතම්මා නොහොත් බුල්කිර් අම්මා (දුව), නාගූර් මොහිඩීන් (පුතා), කාදර් මොහිඩීන් (පුතා), සාවුල් හමීඩ් (පුතා) |

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## "හෙමරජික් සෙප්ටිසීමියා" නමැති භයානක ගව රෝගය පැතිරියාම

වයඹ පලාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඩ විල්ලි හත්පත්තුවේ ගන්නෑව කෝරළයේ කලුගොමුව පළාතේ ගවයින් අතර "හෙමරජික් සෙප්ටිසීමියා" නමැති රෝගය පැතිරියන බැවින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ දිසාපති තැන්පත් ඇන්තනි ලොයිඩ් පෙරේරා වන මා විසින්; සතුන්ගේ බෝවන රෝග සම්බන්ධ ආඥපනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය යටතේ පහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය බෝවන රෝග ඇති ප්‍රදේශයක් ලෙස සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි:—

උතුරට : දූනුකෙවත්ත පළාත,;

දකුණට : කෑගලු දිස්ත්‍රික්කය;

නැගෙනහිරට : වටරැක පළාත;

බස්නාහිරට : ඉරිමින්න පළාත.

2. මෙම ආඥපණතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරනලද ඉහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයින් හෝ ගවයින් බඳිනාලද වාහන මෙම දැන්වීම මා [illegible] අවලංගු කරන තෙක් ගෙනියෑම තහනම් කරමි.

3. තවද 1937 දී සම්මත කරනලද "සතුන්[illegible] බෝවන රෝග" පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරනලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරීන් විසින් නීතියානුකූල[illegible] ක්‍රියා කරන අයුරු, ගව හිමියන් හා කරත්ත කරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර එම නීති රීති සම්බන්ධව වැඩි විස්තර කුරුණෑගල පශු වෛද්‍ය තැනගෙන් හෝ වැඩ විල්ලි හත්පත්තුව කරවන ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කායර්‍යාලයෙන් ලබාගත හැකි බව මෙයින් වැඩිදුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශණය අද දින පටන් වලන්ගු බව දත යුතුයි.

ඒ. ඇල්. පෙරේරා,
කුරුණෑගල දිස්ත්‍රික්කයේ දිසාපති තැන.

1958ක්වූ ජූලි මස 25 වැනි දින,
කුරුණෑගල කච්චේරියේදිය.

---

## ගවයින් අතර කුරලෙඩ සහ කටලෙඩ රෝගය පැතිරියෑම

වයඹ පලාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දඹදෙණි හත්පත්තුවේ මයුරාවතී සහ නැගෙනහිර උඩුකහ කෝරළවල, කොහොලාන, පොරමඩල සහ වඩුගෙදර පළාත්වල ගවයින් අතර කුරලෙඩ සහ කටලෙඩ නමැති රෝගය පැතිරි යන බැවින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ දිසාපති තැන්පත් ඇන්තනි ලොයිඩ් පෙරේරා වන මා විසින්, සතුන්ගේ බෝවෙන රෝග සම්බන්ධ ආඥපනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය යටතේ පහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය බෝවෙන රෝග ඇති ප්‍රදේශයක් ලෙස සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි:—

(1) කොහොලාන පළාත/නැගෙනහිර උඩුකහ කෝරළය:

උතුරට :—පොරමඩල සහ නුගවෙල පළාත් ;
නැගෙනහිරට :—යටිගල්ඔලුව පළාත ;
දකුණට :—මහඔය ;
බටහිරට :—අලව්ව පළාත .

(2) පොරමඩල පළාත/නැගෙනහිර උඩුකහ කෝරළය :

උතුරට :—වාදුව සහ උඩුමුල්ල පළාත් ;
නැගෙනහිරට :—මාවත්ත සහ යටිගල්ඔලුව පළාත් ;
දකුණට :—කොහොලාන පළාත ;
බටහිරට :—ඉහළවැත්තාව පළාතට .

(3) වඩුගෙදර පළාත/මයුරාවතී කෝරළය:

උතුරට : කටුගම්පොල හත්පත්තුවේ දික්වෙල ගම සහ දියදෙර පළාත ;
නැගෙනහිරට : කටුවත්තේවෙල පළාත ;
දකුණට: කටුවත්තේවෙල පළාත ;
බටහිරට : දියදෙර පළාත .

2. මෙම ආඥපනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද ඉහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශවලට හෝ ඉන් පිටතට ගවයින් හෝ ගවයින් බඳිනාලද වාහන මෙම දැන්වීම මා විසින් අවලංගු කරනතෙක් ගෙනියෑම තහනම් කරමි.

3. තවද 1937 දී සම්මත කරන ලද "සතුන්ගේ බෝවන රෝග" පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරනලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරීන් විසින් නීතියානුකූලව ක්‍රියාකරන අයුරු ගව හිමියන් හා කරන්න කරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර එම නීති රීති සම්බන්ධව වැඩි විස්තර පොල්ගහවෙල පශු වෛද්‍ය තැනගෙන් හෝ දඹදෙනි හත්පත්තුව කරවන ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කායර්‍යාලයෙන් ලබාගත හැකි බව මෙයින් වැඩිදුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අදි දින පටන් වලංගු බව දත යුතුය.

ඒ. ඇල්. පෙරේරා,
කුරුණෑගල දිස්ත්‍රික්කයේ දිසාපති තැන.

1958 ක්වූ ජූලි මස 24 වැනි දින,
කුරුණෑගල කච්චේරියේදීය.

---

## "හෙමරජික් සෙප්ටිසීමියා" නමැති භයානක ගව රෝගය පැතිරියෑම

වයඹ පලාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දඹදෙණි හත්පත්තුවේ බටහිර ඔතොට කෝරළයේ උඩපොල පළාතේ ගවයින් අතර "හෙමරජික් සෙප්ටිසීමියා" නමැති රෝගය පැතිරී යන බැවින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ දිසාපති තැන්පත් ඇන්තනි ලොයිඩ් පෙරේරා වන මා විසින්, සතුන්ගේ බෝවන රෝග සම්බන්ධ ආඥපනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය යටතේ පහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය බෝවන රෝග ඇති ප්‍රදේශයක් ලෙස සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි :—

උතුරට : ඇගල්ල සහ කැබිලිත්තවල පළාත්;
දකුණට : මඩලාගම සහ මාවත්ත පළාත්;
නැගෙනහිරට : කැබිලිත්තවල සහ මඩලාගම පළාත්;
බස්නාහිරට : වාදුව සහ මාවත්ත පළාත්.

2. මෙම ආඥපනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයින් හෝ ගවයින් බඳිනාලද වාහන මෙම දැන්වීම මා විසින් අවලංගු කරනතෙක් ගෙනියෑම හතනම් කරමි.

3. තවද 1937 දී සම්මත් කරන ලද "සතුන්ගේ බෝවන රෝග" පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරනලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරීන් විසින් නීතියානුකූලව ක්‍රියා කරන අයුරු ගව හිමියන් හා කරත්ත කරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර එම නීති රීති සම්බන්ධව වැඩි විස්තර පොල්ගහවෙල පශු වෛද්‍ය තැනගෙන් හෝ දඹදෙණි හත්පත්තුව කරවන ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කායර්‍යාලයෙන් ලබාගත හැකි බව මෙයින් වැඩිදුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වලංගු බව දත යුතුයි.

ඒ. ඇල්. පෙරේරා,
කුරුණෑගල දිස්ත්‍රික්කයේ දිසාපති තැන.

1958 ක්වූ ජූලි මස 24 වැනි දින,
කුරුණෑගල කච්චේරියේදිය.

## ප්‍රකාශණයයි

අනුරාධපුර දිස්ත්‍රික්කයේ හුරුළු පළාතේ ප්‍රාදේශීය ආදයම් නිළධාරි කොට්ඨාශයට අයත් අංක 37, 38 සහ 40ඒ දරණ ගම්මුලාදෑනි කොට්ඨාශ වල ගවයින් අතර කුර සහ මුව වසංගතය පැතිරී ඇති හෙයින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ දිසාපති, දොන් චාල්ස් ලයනල් අමරසිංහ වන මා විසින් බෝවන රෝග පිළිබඳ ආඥපනතේ 327 වැනි පරිච්ඡෙදයේ 4 වෙනි වගන්තිය යටතේ පහත සඳහන් මායිම් ඇතුළත හුරුළු පළාතේ අංක 37, 38 සහ 40ඒ යන ගම්මුලාදෑනි කොට්ඨාශ ''වසංගත ඇති ප්‍රදේශයන්'' මෙන් සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි :—

**තුලාන 37**

උතුරට : අංක 37ඒ දරණ තුලානේ මායිම;
නැගෙනහිරට : අංක 27බී සහ අංක 36 දරණ තුලාන් වලමායිම්;
දකුණට : අංක 38, 39 සහ 27බී දරණ තුලාන්වල මායිම්;
බස්නාහිරට : නැගෙනහිර නුවරගම් පළාතේ මායිම්.

**තුලාන 38**

උතුරට : අංක 24බී, 25 සහ 37 දරණ තුලාන්වල මායිම්;
නැගෙනහිරට : අංක 39 දරණ තුලානේ මායිම;
දකුණට : අංක 40 දරණ තුලානේ මායිම;
බස්නාහිරට : අංක 41ඒ සහ 41බී දරණ තුලාන්වල මායිම්;

**තුලාන 40ඒ**

උතුරට : අංක 40 දරණ තුලානේ මායිම;
නැගෙනහිරට : අංක 44 දරණ තුලානේ මායිම;
දකුණට : අංක 41බී තුලානේ මායිම;
බස්නාහිරට : අංක 41 සහ 43බී දරණ තුලාන්වල මායිම්.

2. මෙම ආඥපනතේ 7 වෙනි වගන්තියේ ප්‍රකාර තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශයන් හෝ ඉන් පිටතට ගවයින් හෝ ගවයින් බඳින ලද වාහන හෝ මෙම දන්වීම ප්‍රකාශකර දෙමසක් යන තුරු ගෙන යාම තහනම් කරමි.

3. තවද 1937 සම්මත කරන ලද සතුන්ගේ බෝවන රෝග පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරණ ලද ප්‍රදේශයට ඒ ඒ නිළධාරීන් විසින් නීත්‍යානුකූලව ක්‍රියා කරනු අයුරු ගව හිමියන් හා කරත්ත කරුවන් වෙත සිහිපත් කරවන අතරම මෙම නීති රීති සම්බන්ධව වැඩි විස්තර හුරුළු පළාත කරවන ප්‍රාදේශීය ආදයම් නිළධාරි තැනගේ කාර්‍යාලයයෙන් හෝ පශු වෛද්‍ය නිළධාරි තැනගේ කාර්‍යාලයයෙන් හෝ, මෙම කච්චේරියෙන් හෝ ලබාගත හැකි බව තව දුරටත් දන්වමි.

ඩී. සී. ඇල්. අමරසිංහ,
අනුරාධපුර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්තතුමා.

1958 ජූලි මස 31 වෙනි දින,
අනුරාධපුර නව ලේකම් කාර්‍යාලයයේදී ය.

---

## වර්‍ෂ 1958 මහියංගන පෙරහැර උත්සවය

වර්ෂ 1948ක්වූ සැප්තැම්බර් මස 10 වෙනි දින අංක 9,902 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේද, වර්ෂ 1951ක්වූ අගෝස්තු මස 17 වෙනි දින අංක 10,283 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේද, වර්ෂ 1955ක්වූ මාර්තු මස 25 වැනි දින අංක 10,778 දරණ ගැසට් පත්‍රයේද පලවූ මහියංගන වන්දනා කරුවන් සම්බන්ධව 10(1) දරණ ව්‍යවස්ථා අනුව බදුළු දිස්ත්‍රික්කයේ දිසාපති තැන්පත් බී. පී.. වී. ඒ. ජේ. පී. සේනාරත්න වන මම මෙහි පහත සඳහන් ස්ථාන වන්දනා කරුවන්ට කෑම බීම බෙදු දීම සහ විකිණීම සඳහා වෙන් කරමි :—

(අ) බදුළු විපය නොහොත් බිබිල-අළුත් නුවර ප්‍රසිද්ධ මහ පාර දිගේ සහ මූණ පා සාද ඇති ගම්කාර්‍ය සභාවෙන් බලය ලත් ස්ථිර ගොඩනැගිලි;

(ආ) බිබිල-අළුත්නුවර-සොරබොර වැව ප්‍රසිද්ධ මහ පාරේ අළුත්නුවර තානායමට උතුරෙන් හා විල්ලෝවැවට නැගෙනහිරින් මගෙන් හෝ බලයලත් නිළධාරි තැනගෙන් අවසර ගෙන සාද ඇති තාවකාලික හෝ ස්ථිර ගොඩනැගිලි;

(ඉ) කඳවුරු ප්‍රදේශයේ වන්දනා කරුවන්ට ලැගුම් පිණිස වෙන් කරන ලද පිට්ටනියේ මවිසින් හෝ බලයලත් නිළධාරි තැනගෙන් ලබාගත් බලපත්‍ර පිට සාදන ලද තාවකාලික ගොඩනැගිලි;

(ඊ) විල්ලෝවැවට දකුණින් පිහිටි අළුත්නුවර-මීගහකිවුල ප්‍රසිද්ධ මහ පාර දිගේ සහ මූණ පා සාද තිබෙන තාවකාලික හෝ ස්ථිර ගොඩනැගිලි; පාර මධ්‍යයේ සිට ගොඩනැගිල්ල ඉදිරිපසට දුර ප්‍රමාණය අඩි 50කට අඩුව තිබුනොත් එම ගොඩනැගිල්ල පාරේ පිහිටි ගොඩනැගිල්ලක් හැටියට සලකනු ලැබේ.

2. ඉහත සඳහන් ස්ථාන හැර මහියංගන කඳවුරු ප්‍රදේශය ඇතුලත අන්කිසි ස්ථානයක මොනම අන්දමේ කෑමක් හෝ බීමක් විකිණීම හෝ බෙදු දීම තහනමය.

බී. පී. වී. ඒ. ජේ. පී. සේනාරත්න.
බ.දි. දිසාපති තැන.

වර්ෂ 1958ක්වූ අගෝස්තු මස 1 වැනි දින,
බදුළු දිසාපති කාර්‍යාලයේදීය.

## වර්‍ෂ 1958වේ මහියංගන පෙරහැර උත්සවය

වර්ෂ 1948 ක්වූ සැප්තැම්බර් මස 10 වැනි දින අංක 9,902 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙන්ද, වර්ෂ 1951ක්වූ අගෝස්තු මස 17 වැනි දින අංක 10,283 දරණ ගැසට් පත්‍රයේද, වර්ෂ 1955 ක්වූ මාර්තු මස 25 වැනි දින අංක 10,778 දරණ ගැසට් පත්‍රයේද, පළවූ මහියංගන වන්දනා ගමන් පිළිබඳ ව්‍යවස්ථා අනුව බදුලු දිස්ත්‍රික්කයේ දිසාපති තැන්පත් බී. පී. වී. ඒ. ජේ. පී. සේනාරත්න වන මම —

(අ) අගෝස්තු මස 16 වැනි දින පටන් ගැනෙන පෙරහැර උත්සවය සැප්තැම්බර් මස 2 වැනි දිනෙන් අවසන් වන බව දනුම්දෙමි;

(ආ) අළුත්නුවර-බිබිල ප්‍රසිද්ධ පාරේ නොහොත් බදුල්ල වීථියේ විල්ලෝ වැව ඉදිරියේ පිහිටි විශෙෂ කඳවුරු වන්දනා කරුවන්ට ලැගුම් ගැනීම සඳහා වෙන් කරමි;

(ඇ) වන්දනා කරුවන්ට බීම සඳහා ජලය සපයනු ලබන දුනුවත්තේ තොටට ඇතුල් වීම තහනම් කරමි;

(ඈ) දේවාල භූමිය, විහාර මළුව, දේවාල මාවත නොහොත් පල්ලේ වීථිය, මැද වීථිය, බෝමළු වීථිය යන ස්ථානයන්හි ආහාර පිසීම තහනම් කරමි;

(ඉ) මැදි වීථිය සහ සංඝාවාසය ඉදිරියේ තිබෙන තාවකාලික ගොඩ නැගිලිවල මා විසින් හෝ බලයලත් නිළධාරියෙකු විසින් නිකුත් කරන ලද අවසර පත්‍ර පිට මල්, සුවඳකූරු, ඉටිපන්දම්, සුවඳ වර්ග, කපුරු, භාර ඔප්පු කිරීම සඳහා අවශ්‍ය රූප යනාදිය විකිණීම සඳහා අවසර දෙමි.

(ඊ) ආහාර පිළිබඳ ව්‍යවස්ථානුකූල පහත සඳහන් ස්ථානයන්හි කෑම බීම් විකිණීම තහනම් කරන අතර වෙන ඕනෑම ද්‍රව්‍යයක් විකිණීමට බලය දෙනු ලැබේ :—

(1) මගෙන් හෝ බලයලත් නිලධාරියෙකුගෙන් අවසර පිට මායිම් පාරේ සාදන තාවකාලික ගොඩනැගිලි,

(2) බිබිල-අළුත්නුවර-සොරබොර වැව ප්‍රසිද්ධ පාරේ අළුත් තානායමට උතුරෙන් විල්ලෝවැවට නැගෙණහිරින් මවිසින් හෝ බලයලත් නිළධාරියෙකුගේ අවසරය පිට සාදන ලද ස්ථිර සහ තාවකාලික ගොඩනැගිලි,

(3) අළුත්නුවර-කරමැටිය-මීගහකිවුල පාරේ විල්ලෝ වැවට දකුණෙන් මගෙන් හෝ බලයලත් නිළධාරියෙකුගේ අවසරය පිට සෑදූනු ස්ථිර සහ තාවකාලික ගොඩනැගිලි,

(4) බිබිල-අළුත්නුවර-සොරබොර වැව ප්‍රසිද්ධ පාරේ විල්ලෝ වැව සහ අළුත්නුවර තානායම අතර සහ අළුත්නුවර-කරමැටිය මීගහකිවුල ප්‍රසිද්ධ පාරේ විල්ලෝ වැවට සහ අළුත්නුවර තානායමට අතර පිහිටා ඇති බලයලත් ස්ථිර ගොඩනැගිලි.

(උ) ඉහත සඳහන් ''ඉ'' වගන්තියේ ද්‍රව්‍ය ඒ ඒ නියම ස්ථානයන්හි හැර මහියංගන ශුද්ධ භූමියේ පහත සඳහන් ස්ථාන ඇතුළත කිසිම ද්‍රව්‍යයක් විකිණීම තහනම් කරමි:—

(1) දේවාල මාවත නොහොත් පල්ලේ වීතිය,
(2) මැද වීථිය,
(3) බෝමළු වීථිය,
(4) දේවාල භූමිය,
(5) විහාර මළුව.

2. බයිසිකල් සහ කරත්ත ඇතුළු සියළුම රථවාහන මගෙන් හෝ බලයලත් නිලධාරියෙකුගෙන් බලපත්‍රයක් නොමැතිව කඳවුරු ප්‍රදේශයට ඇතුල් කිරීම තහනම්ය.

3. බින්තැන්නේ ආදයම් පාලක නිළධාරි තුමා විසින් ඔහුගේ කැමැත්ත පරිදි දිය හැකිව තිබෙන ආණ්ඩුවේ ඉඩම් වෙළඳ සැල් දැමීම සඳහා බද්දට දෙනු ලැබේ. එම ස්ථානවල සාදන ලද ගොඩනැගිලි සෞඛ්‍ය උපදෙස් වලට එකඟව නොමැති නම් මොනම වෙළඳාමක්වත් කිරීමට ඉඩ දෙනු නොලැබේ. බලයලත් නිලධාරියෙක් හෝ මවිසින් නියම කළහොත් සෑම කඩකරුවෙක්ම එම ස්ථානවල වැසිකිළි එකක් හෝ දෙකක් සැපයිය යුතුයි.

4. මගෙන් හෝ බලයලත් නිළධාරියෙකුගෙන් ලබාගත් අවසර පත්‍ර නොමැතිව කඳවුරු ප්‍රදේශයේ කිසිම තාවකාලික ගොඩනැගිල්ලක් සෑදීමට අවසර දෙනු නොලැබේ.

5. මෙහි පහත සඳහන් ව්‍යවස්ථාව මහජනයාගේ විශේෂ කල්පනාවට භාජන කරන අතර, ඊට අනුව ක්‍රියා කිරීම අවශ්‍ය බව කරුණාවෙන් මතක් කරමි:—

**15 වෙනි ව්‍යවස්ථාව**

''කිසිවෙකු විසින් ආණ්ඩුවේ ඒජන්ත තුමාගෙන් කලින් අවසර ලබාගෙන මිස වීථියක් වශයෙන් පාවිච්චි කරන්නාවූ හෝ වෙන් කර තිබෙන්නාවූ යම් බිමක් හෝ කඳවුරු ප්‍රදේශය තුළ ගං ඉවුර මෙන් සෑදී තිබෙන්නාවූ යම් බිමක් ඇසුරු කරගෙන යම්කිසි මඩුවක් හෝ යමකිසි අන්දමක ගොඩනැගිල්ලක් සෑදීම හෝ විශාල කිරීම නොකළ යුතුයි''.

රතිඤ්ඤ, වෙඩි ආදිය කඳවුරු ප්‍රදේශයේ පත්තුකිරීම තහනම්ය.

බී. පී. වී. ඒ. ජේ. පී. සේනාරත්න,
බ. දි. දිසාපති තුමා.

වර්ෂ 1958 අගෝස්තු මස 1 වැනි දින,
බදුළු දිසාපති කාර්‍යාලයේදීය.

---

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.